ඩෙන්මාර්ක්

# රැකවරණ සහ සංක්‍රමණ කළමනාකරණ නියාමනය පිළිබඳ ව ඔබ දැනගත යුතු දේ

A ප්‍රකාරය

ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවන්




SINHALESE

# පටුන

ඔබට මෙම විස්තර පත්‍රිකාව ලැබෙන්නේ ඇයි? 3

ජාත්‍යන්තර ආරක්ෂාව යනු කුමක්ද සහ එය ලබා ගත හැක්කේ කාහටද? 3

ඊකවරණ සහ සංක්‍රමණ කළමනාකරණ නියාමනය යනු කුමක්ද? 4

ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන EU+ රටද යන්න පිළිබඳ ව තීරණයක් බලාපොරොත්තුවෙන් සිටින අතරතුර ඔබේ අයිතීන් 5

ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන EU+ රටද යන්න පිළිබඳ ව තීරණයක් බලාපොරොත්තුවෙන් සිටින අතරතුර ඔබ රැඳී සිටිය යුත්තේ කොහේද? 7

මෙම ක්‍රියාවලියේ දී ඔබෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද? 7

ඔබ පෙන්විය යුතු ලේඛන මොනවාද? 8

ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබා දීමට ඔබ බැඳී සිටින්නේ ඇයි? 9

ඔබ ඔබේ වගකීම් ඉටු නොකරන්නේ නම් එහි ප්‍රතිවිපාක මොනවාද? 10

රඳවා තබා ගැනීම යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? 11

ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන EU+ රට ද යන්න බලධාරීන් තීරණය කරන්නේ කෙසේද? 12

ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන EU+ රටද යන්න වටහා ගැනීමට උපකාර කිරීම සඳහා ඔබව සම්මුඛ පරීක්ෂණයකට ලක් කළ හැකිය 15

සැමවිටම සම්මුඛ පරීක්ෂණයක් පවත්වනවා ද? 17

ඔබට වෙනත් EU+ රටක පවුලක් සිටින බව සනාථ කිරීමට ඔබට සැපයිය හැකි සාක්ෂි මොනවාද? 18

ක්‍රියාවලියට කොපමණ කාලයක් ගතවේ ද? 19

ඔබ දැනටමත් වෙනත් EU+ රටක ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කර ඇත්නම් කුමක් කළ යුතුද? 20

තීරණය ගත් පසු කුමක් සිදුවේ ද? 21

අභියාචනා ක්‍රියාපටිපාටිය පිළිබඳ ව ඔබ දැනගත යුතු දේ (අත්හිටුවන ලද බලපෑම සහ ස්වාධීන අභියාචනා ඒකාබද්ධ කළ විට) 22

කුමන පුද්ගලික දත්ත රැස් කරනු ඇති ද? 24

ඔබේ පුද්ගලික දත්ත සම්බන්ධ ව ඔබට ඇති අයිතීන් මොනවාද? 24

## ඔබට මෙම විස්තර පත්‍රිකාව ලැබෙන්නේ ඇයි?

ඔබ EU+ රටවල් 31 න් එකක ජාත්‍යන්තර ආරක්ෂාව (රැකවරණය ලෙස ද හැඳින්වේ) ඉල්ලා ඇත. මෙයින් අදහස් වන්නේ ඔබ දැන් ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්කරුවෙකු වන බවයි. ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වෙනත් EU+ රටක් වගකිව යුතු වීමට හැකියාව ඇත. ඔබ දැන් එම තීරණය ලැබෙන තුරු බලා සිටියි.

EU+ රටවල් සහයෝගයෙන් කටයුතු කරන ආකාරය වටහා ගැනීම වැදගත් වන්නේ මෙය ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන රට ද යන්නට බලපෑ හැකි බැවිනි.

මෙම විස්තර පත්‍රිකාවෙන් ඔබට අවශ්‍ය සියලු තොරතුරු සොයාගත හැකිය.

## ජාත්‍යන්තර ආරක්ෂාව යනු කුමක්ද සහ එය ලබා ගත හැක්කේ කාහටද?



හිංසා පීඩාවන්ට ඇති බිය හෝ බරපතල හානියක් සිදුවීමේ සැබෑ අවදානමකට මුහුණ දීමට සිදුවීම හේතුවෙන් ඔබට ඔබේ රටට ආපසු යාමට නොහැකි නම් ඔබට ජාත්‍යන්තර ආරක්ෂාව අවශ්‍ය විය හැකිය. මෙයින් අදහස් වන්නේ, උදාහරණයක් ලෙස, ඔබේ ජීවිතය හෝ නිදහස අනතුරක පවතින බවත්, ඔබේ රටේ බලධාරීන් ඔබ මුහුණ දෙන අනතුරෙන් ඔබව ආරක්ෂා නොකරනු ඇති බවත් ය.

ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳ වැඩිදුර තොරතුරු වෙනම විස්තර පත්‍රිකාවකින් ඔබට ලැබෙනු ඇත.

**ඔබ දැන් ඩෙන්මාර්ක් හි සිටින අතර, එය EU රටකි.**
**EU+ රටවල් වන්නේ:**

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ, ස්විට්සර්ලන්තය.


## රැකවරණ සහ සංක්‍රමණ කළමනාකරණ නියාමනය යනු කුමක්ද?




EU+ රටවල් රැකවරණ සහ සංක්‍රමණ කළමනාකරණ නියාමනය (AMMR) ලෙස හඳුන්වන පොදු නීතියකට එකඟ වී තිබේ. ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන අයදුම්පතක් පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු රට තීරණය කිරීමට මෙම නීතිය උපකාරී වේ. එක් රටකට එකවර පමණ ඉක්මවා අයදුම්පත් ලැබෙන්නේ නම්, EU+ රටවලට එකිනෙකාට උපකාර කිරීමට ද මෙම නීතිය ඉඩ සලසයි.

EU+ රටවලින් එක රටක් ඔබේ අයදුම්පත පරීක්ෂා කරන බවට ඔබට සහතික වන නමුත් වගකිව යුත්තේ කුමන EU+ රට ද යන්න ඔබට තෝරා ගත නොහැකිය. ඔබේ අයදුම්පත පරීක්ෂා කරන රට තීරණය කරනු ලබන්නේ AMMR නීතියෙහි ඇති රීතීන් මඟිනි.

මෙම විස්තර පත්‍රිකාවේ ඔබට නොවැටහෙන යමක් තිබේ නම්, ඔබට ආගමන නිලධාරියෙකුගෙන් විමසිය හැකිය.



මෙම අවස්ථාවේ දී, EU+ රටවල් ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුත්තේ කුමන රට ද යන්න පමණක් තීරණය කරයි.

ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වෙනත් EU+ රටක් වගකිව යුතු බව තීරණය කළහොත්, ඔබව එම රටට මාරු කර යවනු ඇත.

## ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන EU+ රටද යන්න පිළිබඳ ව තීරණයක් බලාපොරොත්තුවෙන් සිටින අතරතුර ඔබේ අයිතීන්




ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම් කරන්නේ පළමු වරට නම්, ඔබට නොමිලේ **නීති උපදේශනය** ලබා ගැනීමේ අයිතිය තිබේ. ඔබට ඕනෑම වේලාවක බලධාරීන්ගෙන් මෙය ඉල්ලා සිටිය හැකිය.

නීති උපදේශකවරයා ඔබේ අයිතිවාසිකම් පිළිබඳ ව ඔබට දැනුම් දෙන අතර ක්‍රියාවලිය අතරතුර ඔබට සහාය වනු ඇත. ඔබ දැනටමත් නීති උපදේශකයෙකු කුලියට ගැනීමට මුදල් ගෙවා ඇත්නම්, බලධාරීන් ඔබට නොමිලේ නීති උපදේශනය ලබා නොදෙනු ඇත. නීති උපදේශනය කණ්ඩායම් සැකසුමකින් ලබා දිය හැකි නමුත් උපදේශකයා ඔබේ පුද්ගලික තොරතුරු වෙනත් පුද්ගලයින් සමඟ බෙදා නොගනු ඇත.

බලධාරීන්ගෙන් ඉල්ලා සිටින්න ඩෙන්මාර්ක්හි ආශ්‍රය පතන්නන් සහ සරණාගතයින්ගේ අයදුම්කරුවන්ගේ අයිතිවාසිකම් සඳහා කටයුතු කරන පෞද්ගලික මානුෂීය සංවිධානයක් වන ඩී.ර්. සි. ඩෙන්මාර්ක් සරණාගත උපකාරක සංවිධානයේ හි (DRC Dansk Flygtningehjælp) සම්බන්ධතා තොරතුරු ලබාදෙන ලෙස. ඔබටත් ඩී.ර්. සි. ඩෙන්මාර්ක් සරණාගත උපකාරක සංවිධානය (DRC Dansk Flygtningehjælp) සමඟ දුරකථන අංකය 3373 5020 හරහා හෝ විද්‍යුත් තැපැල advice@drc.ngo හරහා සම්බන්ධ විය හැකිය. ඩී.ර්. සි. ඩෙන්මාර්ක් සරණාගත උපකාරක සංවිධානය (DRC Dansk Flygtningehjælp) බොහෝ විට සැන්ඩ්හෝල්ම් සෙන්ටර් (Center Sandholm) හිද සිටී. ඩී.ර්. සි. ඩෙන්මාර්ක් සරණාගත උපකාරක සංවිධානය (DRC Dansk Flygtningehjælp) විසින් ආශ්‍රය පතන්නන්ට සම්පූර්ණ ආශ්‍රය ක්‍රියාවලිය පුරා නොමිලේ සහ ස්වාධීන නීති උපදේශන සේවා ලබා දෙයි. ක්‍රියාවලිය සහ ඔබගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්න තිබේ නම්, ඔබට ඩී.ර්. සි. ඩෙන්මාර්ක් සරණාගත උපකාරක සංවිධානය (DRC Dansk Flygtningehjælp) සමඟ සම්බන්ධ විය හැක. ඩී.ර්. සි. ඩෙන්මාර්ක් සරණාගත උපකාරක සංවිධානය (DRC Dansk Flygtningehjælp) විසින් ලබා දෙන උපදේශන සේවා පිළිබඳ වැඩිදුර තොරතුරු මෙම වෙබ් අඩවියේද කියවිය හැකිය: https://asyl.drc.ngo/ මඟින් බලධාරීන් සම්බන්ධ කර ගැනීමෙන් ඔබට නීති උපදේශකයෙකු ඉල්ලා සිටිය හැකිය.



ඔබේ තත්ත්වය පිළිබඳ ව කතා කිරීමට ඔබට පහසුවක් වන්නේ නම්, ඔබට පිරිමි හෝ ගැහැණු භාෂා පරිවර්තකයෙකු සහ නඩු භාර නිලධාරියෙකු ඉල්ලා සිටිය හැකිය. හැකි සෑමවිට ම බලධාරීන් ඔබේ කැමැත්තට ගරු කරනු ඇත.



ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන EU+ රට ද යන්න තීරණය කිරීම සඳහා ක්‍රියාපටිපාටිය පිළිබඳ යාවත්කාලීන තොරතුරු ඉල්ලා සිටීමට ඔබට අයිතියක් ඇත. යාවත්කාලීන තොරතුරු ඉල්ලා සිටීමට ඔබ කැමති නම්, ඔබට එය ඔබට කළ හැක්කේ මෙම වෙබ් අඩවිය [www.nyidanmark.dk/da/Kontakt-os/](www.nyidanmark.dk/da/Kontakt-os/) හරහා ඩෙන්මාර්ක් ආගමන සේවාව (Udlændingestyrelsen) සමඟ සම්බන්ධ වීමෙනි.

මඟින් බලධාරීන් සම්බන්ධ කර ගත හැකිය.




රැකවරණ ක්‍රියාපටිපාටියේ ඕනෑම පියවරක දී එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) හා සම්බන්ධ වී අදහස් හුවමාරු කරගැනීමට ඔබට අයිතිය ඇත.

UNHCR රැකවරණය සොයන්නන්ගේ සහ සරණාගතයින්ගේ අවශ්‍යතා සහ අයිතීන් ආරක්ෂා කරයි.

UNHCR හි සම්බන්ධතා තොරතුරු සහ රැකවරණ ක්‍රියාපටිපාටිය පිළිබඳ තොරතුරු UNHCR වෙබ් පිටුව වන [https://help.unhcr.org/](https://help.unhcr.org/) වෙතින් සොයාගත හැකිය.

**ඔබට ලැබෙන සහාය සහ සේවාවන් පිළිබඳ අමතර තොරතුරු වෙනම විස්තර පත්‍රිකාවකින් සොයාගත හැකිය.**

## ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන EU+ රටද යන්න පිළිබඳ ව තීරණයක් බලාපොරොත්තුවෙන් සිටින අතරතුර ඔබ රැඳී සිටිය යුත්තේ කොහේද?



- දැනට ඔබ මෙම රට තුළ නැවතී සිටීමට බැඳී සිටියි.
- බලධාරීන් විසින් ඔබට අවසර ලබා දෙන්නේ නම් පමණක් ඔබට වෙනත් EU+ රටකට ගමන් කිරීමට අවසර ඇත.
- වෙනත් EU+ රටක් ඔබේ අයදුම්පත පරීක්ෂා කරනු ඇති බව බලධාරීන් තීරණය කළහොත්, බලධාරීන් එම රටට ඔබේ ගමන සූදානම් කරනු ඇත.

## මෙම ක්‍රියාවලියේ දී ඔබෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද?

ඔබ පහත සඳහන් දේවල් කළ යුතුය:

- ✔ ඔබේ අයදුම්පත ලියාපදිංචි කරන අතරතුර මෙම රට තුළ රැඳී සිටින්න.
- ✔ ඔබට අතීතයේ දී වීසා බලපත්‍රයක් හෝ පදිංචි බලපත්‍රයක් නිකුත් කර ඇත්නම්, එය ඔබට නිකුත් කළ රටට ඔබ එහි පැමිණි පසු එහි රැකවරණය සඳහා අයදුම් කරන්න.
- ✔ ඔබේ අනන්‍යතාවය සනාථ කිරීමට ඔබ සතුව ඇති සියලුම හැඳුනුම් ලේඛන ඉදිරිපත් කරන්න. ඔබ සතුව හැඳුනුම් ලේඛනයක් තිබුණ ද එය තවදුරටත් ඔබ ළඟ නොමැති නම්, ඔබේ රටේ රජය විසින් අතීතයේ දී ඔබට එවැන්නක් ලබා දුන් බව ඔබ තව දුරටත් බලධාරීන්ට දැනුම් දිය යුතුය.
- ✔ ඔබ වෙනත් EU+ රටකට ගමන් කර තිබෙන ඕනෑම වේලාවක බලධාරීන්ට ඒ බව දන්වන්න.
- ✔ අවසරයකින් තොරව EU+ රටක නැවතී සිටියේ නම් ඒ බව බලධාරීන්ට දන්වන්න.
- ✔ වෙනත් EU+ රටක ඔබට යම් සමීප පවුලක් සිටී නම් ඒ බව බලධාරීන්ට දන්වන්න.

❗ **වැදගත්!** ඔබේ ඇඟිලි සලකුණු ලබා දී ඔබේ ඡායාරූපය ලබා ගැනීමට ඉඩ දීමට ඔබ නීතියෙන් බැඳී සිටියි.

## ඔබ පෙන්විය යුතු ලේඛන මොනවාද?

ඔබ සතුව පවතින පහත සඳහන් ඒවා ආශ්‍රිත සියලුම ලේඛන බලධාරීන් සමඟ බෙදා ගන්න:




- ඔබේ අනන්‍යතාවය (උප්පැන්න සහතිකය, විදේශ ගමන් බලපත්‍රය, හැඳුනුම්පත)



- EU+ රටවල සිටින සමීප පවුලේ සාමාජිකයන් (නිල ලේඛන, ඔබ සම්බන්ධතා පවත්වන බවට සාක්ෂි)




- EU+ රටවල පෙර නැවතී සිටීම් (පදිංචි බලපත්‍රයක්, වීසා බලපත්‍රයක් හෝ පාසල් හෝ විශ්ව විද්‍යාල ඩිප්ලෝමාවක් ලබා ගැනීම සඳහා).

මෙම තොරතුරු හැකි ඉක්මනින් ලබා දෙන්න. මේ ආකාරයෙන්, ඔබේ අයදුම්පත සඳහා වගකිව යුතු EU+ රට ඉක්මනින් හඳුනාගත හැකිය.


## ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූපය ලබා දීමට ඔබ බැඳී සිටින්නේ ඇයි?



මේ රටේ බලධාරීන් ඔබේ ඇඟිලි සලකුණු සහ ඡායාරූප ලබා ගනු ඇත. මෙම දත්ත, ඔබේ අනන්‍යතාවය පිළිබඳ තොරතුරු සහ අනෙකුත් අදාළ තොරතුරු සමඟ, යුරෝඩැක් නම් හවුල් යුරෝපීය දත්ත සමුදායක් වෙත සම්ප්‍රේෂණය කෙරෙනු ඇත.

මෙම දත්ත සමුදාය ඔබේ තොරතුරු ලබා ගැනීම සඳහා ඔබේ දත්ත සැකසිය හැකි EU+ රටවල් 31 හිම භාවිත කරයි. ඔබ අවසරයකින් තොරව වෙනත් EU+ රටකට ගොස් එහි දී ඔබේ ඇඟිලි සලකුණු නැවත ලබා ගන්නේ නම්, යුරෝඩැක්හි ගබඩා කර ඇති ඔබේ සියලුම දත්ත එම රටේ බලධාරීන් විසින් දකිනු ඇත.

යුරෝඩැක් දත්ත සමුදාය පිළිබඳ වැඩිදුර තොරතුරු වෙනම විස්තර පත්‍රිකාවකින් ලබා දී ඇත.




## ඔබ ඔබේ වගකීම් ඉටු නොකරන්නේ නම් එහි ප්‍රතිවිපාක මොනවාද?



ඔබ බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු නොකරන්නේ නම්, එය ඔබේ අයදුම්පතට අහිතකර ප්‍රතිවිපාක ඇති කරනු ඇත.

ඔබ ඔබේ ඇඟිලි සලකුණු ලබා නොදුන්නහොත්, ඔබ තවදුරටත් යුරෝපයේ රැකවරණය සඳහා උනන්දුවක් නොදක්වන බවට බලධාරීන් නිගමනය කළ හැකිය. ඔවුන් ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම නවත්වනු ඇත, එයින් අදහස් වන්නේ ඔබට තවදුරටත් එම රටේ රැඳී සිටීමට අයිතියක් නොමැති බවයි.

ඔබ අවසරයකින් තොරව වෙනත් EU+ රටකට ගමන් කරන්නේ නම් හෝ වෙනත් EU+ රටක ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම් කරන්නේ නම්, ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු EU+ රටකට ඔබව ආපසු යැවීමට ඉඩ තිබේ.




ඔබ සිටිය යුතු රටට අමතරව වෙනත් EU+ රටක සිටී නම්, ඔබේ නිදහස සීමා විය හැකි අතර ඔබට අඩු සහායක් ලැබිය හැකිය.

## රඳවා තබා ගැනීම යන්නෙන් අදහස් වන්නේ කුමක්ද?

රඳවා තබා ගැනීම යන්නෙන් අදහස් වන්නේ ඔබට නිදහසේ පිටව යා නොහැකි නිශ්චිත පහසු ස්ථානයක ඔබව තබා ඇති බවයි. ඔබව රඳවා තබා ගැනීමට බලධාරීන්ට වලංගු හේතුවක් තිබිය යුතුය.  ඔබේ තත්ත්වයේ දී වෙනත් විකල්පයක් කළ නොහැකි බවට ඔවුන් සහතික විය යුතුය. බලධාරීන් තීරණය කිරීමට පෙර ඔබේ පුද්ගලික තත්ත්වය පිළිබඳව සලකා බලනු ඇත. රඳවා තබා ගැනීමට හේතූන් විය හැක්කේ, උදාහරණයක් ලෙස:



- රඳවා තබා ගැනීමකින් තොරව ඔබේ රැකවරණ අයදුම්පතෙහි වැදගත් අංග (උදාහරණයක් ලෙස ඔබේ අනන්‍යතාවය) සත්‍යාපනය කළ නොහැකිය
- ඔබ නිශ්චිත ස්ථානයක නැවතී සිටීමේ වගකීමට ගරු නොකළ අතර, ඔබ නැවත පලා යාමේ අවදානමක් ඇත, එමෙන්ම බලධාරීන්ට ඔබ වෙත ළඟා විය නොහැකිය
- ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීමට වගකිව යුතු EU + රටට මාරු කර යැවීමට ඔබට තීරණයක් ලැබී ඇති අතර මාරුවීමට පෙර ඔබ පලා යාමේ අවදානමක් ඇත
- ඔබ ආරක්ෂක අවදානමක් ඇති බව පෙන්වයි.

ඔබව රඳවා තබාගෙන සිටී නම්, ඔබට තීරණයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකි අතර ඔබට නොමිලේ නීති සහාය සහ නියෝජනය ඉල්ලා සිටිය හැකිය.

**වැදගත් !** ඔබ අවසරයකින් තොරව වෙනත් EU+ රටකට ගමන් කරන්නේ නම්, එය අනාගතයේ දී ඔබව රඳවා තබා ගැනීමට ඇති අවදානම වැඩි කරයි.

## ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන EU+ රට ද යන්න බලධාරීන් තීරණය කරන්නේ කෙසේද?

මෙය EU+ රටක ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන ඔබේ පළමු අයදුම්පත නම්, යම් EU+ රටක් ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු වීමට හේතු කිහිපයක් තිබේ.

### 1) පවුල් සබඳතා



පළමු සහ වැදගත්ම හේතුව වන්නේ සමීප පවුලේ සාමාජිකයෙකුට දැනටමත් ජාත්‍යන්තර ආරක්ෂාව ලබා දී තිබීම හෝ දැනට වෙනත් EU+ රටක ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කරමින් සිටීම වන අතර ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා වන ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීමට පෙර ඔබ ඔවුන් සමඟ නැවත එක්විය යුතුය.

සමීප පවුලේ සාමාජිකයන් ලෙස සැලකෙන්නේ:

- ඔබේ සැමියා හෝ බිරිඳ
- ඔබ ස්ථිර සම්බන්ධතාවයක් බෙදා ගන්නා ඔබේ අවිවාහක සහකරු
- ඔබේ දරුවා (වයස අවුරුදු 18 ට අඩු සහ අවිවාහක).

**වැදගත් !** EU+ රටවල කලාපයට ඇතුළු වීමට පෙර ඔබට එම පුද්ගලයා සමඟ සම්බන්ධතාවයක් තිබූ බව හැකි ඉක්මනින් සනාථ කිරීමට ඔබට හැකි විය යුතුය. මෙම කාල පරිච්ඡේදයට ඔබේ මව් රටෙන් පැමිණි ගමන ඇතුළත් විය හැකිය.

වෙනත් EU+ රටක ජීවත් වන ඔබේ පවුලේ සාමාජිකයෙකු සිටී නම්, තොරතුරු සැපයීමේ හොඳම ක්‍රමය වන්නේ **'පවුල් සෙවීමේ සැකිල්ල'** ලෙස හඳුන්වන පෝරමය සම්පූර්ණ කිරීමයි. වෙනත් EU+ රටක ජීවත් වන ඔබේ පවුලේ සාමාජිකයෙකු ඔබට සිටින අතර ඔබට තවමත් මෙම පෝරමය ලැබී නොමැති නම්, නිලධාරියෙකු හෝ ඔබේ නීති උපදේශකයා සමඟ කතා කරන්න. පෝරමය පිරවීමට ඔවුන්ට ඔබට උපකාර කළ හැකිය.

**'ඔබට වෙනත් EU+ රටක පවුලක් සිටින බව සනාථ කිරීමට ඔබට සැපයිය හැකි සාක්ෂි මොනවාද?'** යන මාතෘකාව යටතේ පවුලේ සාමාජිකයන් සමඟ නැවත එක්වීමේ හැකියාව පිළිබඳ ව වඩාත් සවිස්තරාත්මක තොරතුරු ඔබට සොයාගත හැකිය.

## 2) නිශ්චිත EU+ රටකට ප්‍රවේශ වීමට අවසරය

EU+ රටක් ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව හැකි වන්නේ:



- ඔබට යම් EU+ රටක වීසා බලපත්‍රයක් හෝ පදිංචි බලපත්‍රයක් තිබේ නම්
- ඔබ EU+ රටකට ප්‍රවේශ වූයේ ඔබේ මව් රටට එම රට සමඟ ගිවිසුමක් තිබෙන නිසා වීසා බලපත්‍රයක් නොමැතිව ඔබට ප්‍රවේශ වීමට අවසර දී තිබීම හේතුවෙන් නම්.

## 3) අධ්‍යාපන සුදුසුකම් හෝ ඩිප්ලෝමාව



- අවම වශයෙන් එක් අධ්‍යයන වර්ෂයක්වත් EU+ රටක තිබෙන අධ්‍යාපන මධ්‍යස්ථානයක පුද්ගලිකව අධ්‍යාපනය ලැබීමෙන් පසු ඔබට සුදුසුකමක් හෝ ඩිප්ලෝමාවක් පිරිනමා ඇත.

## 4) නිශ්චිත EU+ රටකට අවිධිමත් ප්‍රවේශ වීම

වෙනත් EU+ රටක් ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුත්තේ:



- ඔබ අවසරයකින් තොරව EU+ රටවලින් එකක බාහිර දේශසීමාව තරණය කර තිබේ නම්



- ඔබේ යුරෝපයට යන ගමනේ දී EU+ රටක බලධාරීන් විසින් ඔබව මුහුදේ දී බේරා ගනු ලැබුවේ නම්



- ඔබ EU+ රටවලින් එකක ගුවන් තොටුපළක සංක්‍රමණ කලාපයක ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම්පතක් ඉදිරිපත් කර තිබේ නම්.

## 5) රැකබලා ගන්නෙකු සහ යැපෙන පවුලේ සාමාජිකයෙකු නැවත එක් කිරීම

ඔබ වෙනත් EU+ රටක සිටින පවුලේ සාමාජිකයෙකුගේ රැකවරණය මත යැපේ නැතහොත් EU+ රටක ඔබේ රැකවරණය මත යැපෙන පවුලේ සාමාජිකයෙකු සිටියි.



යැපෙන පවුලේ සාමාජිකයාට පහත සඳහන් හේතූන් නිසා උපකාර අවශ්‍ය විය හැකිය:

- ගර්භණීභාවය
- අලුත උපන් දරුවෙකු සිටීම
- බරපතල මානසික හෝ ශාරීරික රෝගයක්
- දැඩි ආබාධිතභාවය
- දැඩි මානසික කම්පනය
- වයස්ගත බව.

යැපෙන්නන් සිටින අවස්ථාවක දී, ඔබට යැපෙන්නන් රැකබලා ගැනීමට හැකි බව හෝ ඔබේ පවුලේ සාමාජිකයාට ඔබව රැකබලා ගැනීමට හැකි බව පෙන්වීමට ඔබට හැකි විය යුතුය.

## 6) මානුෂීය හේතු

නිශ්චිත EU+ රටකට ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීමට මානුෂීය හේතුවක් තිබිය හැකිය. මෙය පහත සඳහන් හේතූන් මත පදනම් විය හැකිය:

- පවුල් සම්බන්ධ කරුණු
- සමාජය සම්බන්ධ කරුණු
- සංස්කෘතිය සම්බන්ධ කරුණු.

ඉහත හේතූන් මත ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීමට වෙනත් EU+ රටක් සඳහා ඉල්ලීමක් කළ හැකි නමුත් අවසාන තීරණය එම රටේ අධිකාරියට භාර වේ.

## ඔබේ අයදුම්පත පරීක්ෂා කරන්නේ කුමන EU+ රට ද යන්න වටහා ගැනීමට උපකාර කිරීම සඳහා ඔබව සම්මුඛ පරීක්ෂණයකට ලක් කළ හැකිය

ඔබ රැකවරණය සඳහා අයදුම් කරන පළමු අවස්ථාව මෙය නම්, බලධාරීන් පුද්ගලික සම්මුඛ පරීක්ෂණයක් පිළියෙළ කළ යුතුය.

**වැදගත් !** මෙය රැකවරණය පිළිබඳ සම්මුඛ පරීක්ෂණයක් නොවනු ඇත. සම්මුඛ පරීක්ෂණයේ අරමුණ වන්නේ ඔබේ අයදුම්පත පරීක්ෂා කළ යුත්තේ කුමන EU+ රට ද යන්න තීරණය කිරීමයි.

**මෙම සම්මුඛ පරීක්ෂණයට ප්‍රධාන අරමුණු හතරක් ඇත:**

- වගකිව යුතු EU+ රට තීරණය කිරීමට බලධාරීන්ට උපකාර වන තොරතුරු රැස් කිරීම සඳහා
- වගකිව යුතු EU+ රට තීරණය කිරීමේ ක්‍රියාපටිපාටිය සිදු කරන ආකාරය පිළිබඳ ව ඔබට ඕනෑම ප්‍රශ්නයක් විමසීමට ඉඩ ලබා දීම සඳහා
- මෙම විස්තර පත්‍රිකාවේ ඇති ඕනෑම තොරතුරක් පිළිබඳ ව ඔබට ප්‍රශ්න විමසීමට ඉඩ ලබා දීම සඳහා
- ඔබව වෙනත් EU+ රටකට මාරු කර යැවීම නොකළ යුතු හේතුව හෝ ඔබට මෙම රටේ රැඳී සිටීමට අවසර දිය යුතු හේතුව ඔබෙන් විමසීම සඳහා.

සම්මුඛ පරීක්ෂණය ඔබට හොඳින් වැටහෙන භාෂාවකින් පැවැත්වෙනු ඇත. [...] සම්මුඛ සාකච්ඡාව පවත්වන පුද්ගලයා සහ පරිවර්තකයා නිශ්චිත ලිංගයක අය විය යුතු යැයි ඔබ කැමති නම්, සම්මුඛ සාකච්ඡාව සඳහා ඔබව කැඳවන අවස්ථාවේදී ඒ පිළිබඳ දැනුම් දෙන්න. ඩෙන්මාර්ක් ආගමන සේවාවට (Udlændingestyrelsen) හැකි නම්, එය සැලකිල්ලට ගෙන කටයුතු කිරීමට උත්සාහ කරනු ඇත.



ඔබ ලබා දෙන කිසිදු තොරතුරක් ඔබේ මව් රටේ රජය හෝ බලධාරීන් සමඟ බෙදා නොගනු ඇත.

සම්මුඛ පරීක්ෂණය අතරතුර අපැහැදිළි කිසිවක් තිබේ නම්, ඔබට ප්‍රශ්න ඇසිය හැකිය. ඔබ සහ නිලධාරියා යන දෙදෙනාම සියල්ල වටහා ගැනීම වැදගත් වේ, ඒ අනුව, ප්‍රශ්න ඉදිරිපත් කිරීම සැමවිටම පිළිගනු ලැබේ.



සම්මුඛ පරීක්ෂණයේ ශ්‍රව්‍ය පටිගත කරනු ලබන අතර, පැවසූ දෙය පිළිබඳ ලිඛිත සාරාංශයක් ඔබට පෙන්වනු ඇත.

ඔබේ පුද්ගලික සම්මුඛ පරීක්ෂණයේ ලිඛිත සාරාංශය ලැබීමෙන් පසු ව, කිසියම් තොරතුරක් වැරදි යැයි ඔබ සිතන්නේ නම් සහ එය සංශෝධනය කිරීමට ඔබ කැමති නම්, ඔබට එසේ කිරීමට ඉල්ලා සිටිය හැකිය.

ඔබට වෙබ් අඩවිය [www.nyidanmark.dk/KontaktAsyl](http://www.nyidanmark.dk/KontaktAsyl) හරහා හෝ පහත සඳහන් QR කේතය භාවිතයෙන් ඩෙන්මාර්ක ආගමන සේවාව (Udlændingestyrelsen) සමඟ සම්බන්ධ විය හැක.

අවශ්‍ය නම්, සම්මුඛ පරීක්ෂණයෙන් පසුව ද ඔබට අමතර ලේඛන ලබා දිය හැකිය, නැතහොත් ඔබව වෙනත් EU+ රටකට මාරු කර යැවීම නොකළ යුත්තේ කුමක් නිසා ද යන්නට හේතු ලබාදිය හැකිය.

ඔබ තවමත් ඉදිරිපත් කර නොමැති තොරතුරු හෝ ලේඛන තිබේ නම්, ඔබ ඒවා බලධාරීන්ට ඉදිරිපත් කළ යුතුය.

ඔබ ඩෙන්මාර්ක් ආගමන සේවාව (Udlændingestyrelsen) වෙත තොරතුරු හෝ ලේඛන ඉදිරිපත් කළ යුතුය: මුල් ලේඛන මෙම ලිපිනයට Udlændingestyrelsen, Farimagsvej 51A, 4700 Næstved, යැවිය යුතුය. අනෙකුත් ලේඛන සහ තොරතුරු මෙම වෙබ් අඩවිය www.nyidanmark.dk/KontaktAsyl හරහා හෝ පහත QR කේතය භාවිතයෙන් විද්‍යුත් ආකාරයෙන් ඉදිරිපත් කළ හැකිය.

## සැමවිටම සම්මුඛ පරීක්ෂණයක් පවත්වනවා ද?

මෙය ඔබ ආරක්ෂණය සඳහා අයදුම් කරන පළමු අවස්ථාව නම්, බලධාරීන්ට පහත හේතූන් මත තව දුරටත් පුද්ගලික සම්මුඛ පරීක්ෂණයක් නොපැවැත්වීමට තෝරා ගත හැකිය:

- ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු EU+ රට දැනටමත් දන්නේ නම්
- ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු EU+ රට තීරණය කිරීමට ඔවුන්ට දැනටමත් ප්‍රමාණවත් තොරතුරු තිබේ නම්
- ඔබට සහභාගී වීමට නොහැකි වූ හේතුව බලධාරීන්ට නොපවසා ඔබ මීට පෙර සම්මුඛ පරීක්ෂණයක් මඟ හැර තිබේ නම්
- ඔබ බලධාරීන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමට අපොහොසත් වී තිබේ නම්.

සම්මුඛ පරීක්ෂණයක් සංවිධානය කර නොමැති නම්, ඔබට සම්මුඛ පරීක්ෂණයක් ඉල්ලා සිටිය හැකිය. ඔබේ තත්ත්වය හැසිරවීමට ප්‍රමාණවත් තොරතුරු දැනටමත් ඔවුන් සතුව ඇතැයි නිලධාරීන් සිතන්නේ නම්, ඔවුන්ට මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ හැකි නමුත් සම්මුඛ පරීක්ෂණය නොපැවැත්වීමට හේතු ඔවුන් විසින් ඉදිරිපත් කළ යුතුය.

ඔබට සම්මුඛ සාකච්ඡාවක් ඉල්ලා සිටීමට අවශ්‍ය නම් මෙම වෙබ් අඩවිය www.nyidanmark.dk/KontaktAsyl හරහා හෝ පහත ඇති QR කේතය භාවිතයෙන් ඩෙන්මාර්ක් ආගමන සේවාව (Udlændingestyrelsen) සමඟ සම්බන්ධ විය හැකිය. සම්මුඛ සාකච්ඡාවක් ඉල්ලා සිටීමට ඔබගේ හේතුව සඳහන් කිරීමට මතක තබා ගන්න.

## ඔබට වෙනත් EU+ රටක පවුලක් සිටින බව සනාථ කිරීමට ඔබට සැපයිය හැකි සාක්ෂි මොනවාද?

ඔබේ පවුලේ සාමාජිකයා පිළිබඳ ව තොරතුරු ලබා දීමේ හොඳම ක්‍රමය වන්නේ **'පවුල් සෙවීමේ සැකිල්ල'** යන පෝරමය සම්පූර්ණ කිරීමයි.

මීට අමතරව, ඔබේ සම්බන්ධතාවය සනාථ කළ හැකි ඕනෑම නිල රජයේ ලේඛනයක් සපයන්න. උදාහරණයක් ලෙස ඔබ ඔබේ පවුලේ සාමාජිකයා සමඟ සම්බන්ධතා පවත්වා ඇති බවට සාක්ෂි, ඡායාරූප, ඊමේල හෝ කෙටි පණිවිඩ වැනි ඔබට වෙනත් ආකාරයේ සාක්ෂි ද සැපයිය හැකිය.



ඔබේ සම්බන්ධතාවය පිළිබඳ ව සාක්ෂි නොමැති නම්, ඔබට සම්බන්ධයක් ඇති බව සනාථ කිරීමට බලධාරීන් ඔබෙන් DNA පරීක්ෂණයක් කිරීමට ඉල්ලා සිටිය හැකිය.

ඔබ දෙදෙනාම නැවත එක්වීමට කැමති බව ලිඛිතව ප්‍රකාශ කළහොත් පමණක් ඔබේ පවුලේ සාමාජිකයා සමඟ නැවත එක්විය හැකිය. ඔබට හැකි නම් මෙම ලේඛනය ඉංග්‍රීසි භාෂාවෙන් ලබා දීමට උත්සාහ කළ යුතුය.

හැකි ඉක්මනින් මෙම තොරතුරු සකස් කිරීම ආරම්භ කරන්න.



පවුල් නැවත එක්වීමේ ක්‍රියාවලිය පිළිබඳ ව ඔබට තවත් ප්‍රශ්න තිබේ නම් හෝ උපදෙස් අවශ්‍ය නම්, ඔබට නීති උපදේශකයෙකුගෙන් උපකාර ඉල්ලා සිටිය හැකිය.

ඔබේ පවුලේ සාමාජිකයෙකු වෙනත් EU+ රටක සිටින නමුත් ඔබට ඔවුන් සමඟ සම්බන්ධතාවය නැති වී ඇත්නම්, ඔවුන් සොයා ගැනීමට ඔබට උපකාර කළ හැකි සංවිධාන තිබේ.

පහත තොරතුරු භාවිතයෙන් ඔබට මෙම සංවිධාන සම්බන්ධ කර ගත හැකිය:
ඩෙන්මාර්ක් රතු කුරුසයේ සොයාබැලීමේ සේවාව (Røde Kors' Eftersøgningstjeneste):
විද්‍යුත් තැපැල tracing@rodekors.dk හෝ දුරකථන අංකය 35 25 92 00.

# ක්‍රියාවලියට කොපමණ කාලයක් ගතවේ ද?



රටවල් අතර සන්නිවේදනය සඳහා සාමාන්‍යයෙන් **මාස එක හමාරක සිට මාස 3** දක්වා කාලයක් ගත වේ, නමුත් ඔබේ තත්ත්වය අනුව මෙය **දිගු විය හැකිය.**



වෙනත් EU+ රටක් ඔබේ අයදුම්පත පරීක්ෂා කරන බව තහවුරු කළහොත්, ඔවුන් ඔබව මාරු කර යැවීමේ ඉල්ලීම පිළිගත් දින සිට **මාස 6ක් ඇතුළත** ඔබව මාරු කර යවනු ඇත.




ඉල්ලීම කළේ ඔබේ පවුලේ සාමාජිකයෙකු වෙනත් EU+ රටක සිටින නිසා නම්, මාරු කර යැවීම **ප්‍රමුඛතාවයෙන් යුතුව සලකනු ඇත.**



ඔබ දැනට **රඳවාගෙන සිටී නම් හෝ** අනාගතයේ දී **රඳවාගෙන සිටිනු ඇත්නම්,** ඔබේ තත්ත්වය **හදිසි තත්ත්වයක් ලෙස සලකනු ඇත.** ඔබේ මාරු කර යැවීම **සති 5ක්** ඇතුළත සංවිධානය කළ යුතුය. සති 5ක් ඇතුළත මාරු කර යැවීම සිදු නොකළහොත්, ඔබව රඳවාගෙන සිටීමෙන් නිදහස් කරනු ඇත. කෙසේ වෙතත්, EU+ රට ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලීම පිළිගත් දින සිට **මාස 6ක් ඇතුළත** ඔබේ මාරු කර යැවීම තව දුරටත් පිළියෙළ කෙරෙනු ඇත.

ඔබ අපරාධයක් කිරීම හේතුවෙන් සිරගත ව සිටී නම්, මාරු කර යැවීමේ කාල සීමාව **උපරිම වශයෙන් වසර 1ක් දක්වා වැඩි කළ හැකිය.**




**වැදගත් !** ඔබ මාරු කර යැවීමේ සංවිධානයේ බලධාරීන්ගෙන් පලා ගියහොත්, සැඟ වී සිටියහොත් හෝ ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු නොකළහොත්, **මාරු කර යැවීම සඳහා වන කාල සීමාව උපරිම වශයෙන් වසර 3ක් දක්වා වැඩි කළ හැකිය.**

## ඔබ දැනටමත් වෙනත් EU+ රටක ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා ඉල්ලුම් කර ඇත්නම් කුමක් කළ යුතුද?

ඔබට ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම් කිරීමට අවසර ඇත්තේ එක් EU+ රටක පමණි. ඔබ දැනටමත් වෙනත් EU+ රටක ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම් කර ඇත්නම්, ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු EU+ රටට ඔබව ආපසු යවනු ඇත.

ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වෙනත් EU+ රටක් වගකිව යුතු බවට තොරතුරු ඇත්නම්, එම රටට දැනුම්දීමක් යවනු ඇත. එම EU+ රට ඔබේ අයදුම්පත පරීක්ෂා කරන බව තහවුරු කරන්නේ නම්, ඔබව මාරු කර යවන්නේ කුමන EU+ රටට ද යන්න සඳහන් **මාරු කර යැවීමේ තීරණයක්** ඔබට ලබා දෙනු ඇත.

මෙය ඔබ ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා අයදුම් කරන පළමු අවස්ථාව නොවේ නම්, හෝ ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වෙනත් EU+ රටක් වගකිව යුතු බව දැනටමත් තීරණය කර ඇත්නම්, බලධාරීන් ඔබ සමඟ පුද්ගලික සම්මුඛ සාකච්ඡාවක් සිදු නොකළ හැකිය.

කෙසේ වෙතත්, ඔබව එම රටට මාරු නොකළ යුතු හේතුව හෝ ඔබට මෙම රට තුළ රැඳී සිටීමට ඉඩ දිය යුතු හේතුව පැහැදිලි කිරීමට ඔබට අවස්ථාව ලැබෙනු ඇත.

මෙම තොරතුරු ලබා දෙන ආකාරය පිළිබඳ ව තොරතුරු ඔබට පහතින් සොයාගත හැකිය:
ඔබට මෙම වෙබ් අඩවිය www.nyidanmark.dk/KontaktAsyl හරහා හෝ පහත QR කේතය භාවිතයෙන් ඩෙන්මාර්ක් ආගමන සේවාව (Udlændingestyrelsen) සමඟ සම්බන්ධ විය හැකිය.

## තීරණය ගත් පසු කුමක් සිදුවේ ද?

වෙනත් EU+ රටකට මාරු කිරීම සඳහා ඔබට මාරු කර යැවීමේ තීරණයක් ලැබුනහොත්, ඔබේ ඇතැම් අයිතීන් අවලංගු කරනු ඇත, උදාහරණයක් ලෙස:

- ඔබට **බොහෝ සේවාවන් සහ සහාය ආකාර නොලැබෙනු ඇත.**
- ඔබට **රැකියාවක නිරත වීමට** හෝ **පාඨමාලා හැදෑරීමට අවසර නොලැබෙනු ඇත.**





ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා EU+ රට තහවුරු කළ හෝ පිළිගත් දින සිට මාස 6ක් ඇතුළත මාරු කිරීම සිදු කළ යුතුය.

ඔබ දැනට රඳවාගෙන සිටී නම්, ඔබේ තත්ත්වය හදිසි තත්ත්වයක් ලෙස සලකනු ඇත. ඔබේ මාරු කර යැවීම සති 5ක් ඇතුළත සංවිධානය කළ යුතුය. සති 5ක් ඇතුළත මාරු කර යැවීම සිදු නොකළහොත්, ඔබව රඳවාගෙන සිටීමෙන් නිදහස් කරනු ඇත.

ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීමට EU+ රට තහවුරු කළ හෝ පිළිගත් දින සිට මාස 6ක් ඇතුළත ඔබේ මාරු කර යැවීම තව දුරටත් පිළියෙළ කෙරෙනු ඇත.

ඔබ අපරාධයක් කිරීම හේතුවෙන් සිරගත ව සිටී නම්, මාරු කර යැවීමේ කාල සීමාව උපරිම වශයෙන් වසර 1ක් දක්වා වැඩි කළ හැකිය.

**වැදගත් !** ඔබ බලධාරීන්ගෙන් පලා ගියහොත් හෝ ඔවුන් සමඟ සහයෝගයෙන් කටයුතු නොකළහොත්, **මාරු කර යැවීම සඳහා වන කාල සීමාව උපරිම වශයෙන් වසර 3ක් දක්වා වැඩි කළ හැකිය.**

## මාරු කර යැවීමේ තීරණයට ඔබ එකඟ නොවන්නේ නම් කුමක් සිදුවේ ද?



ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වෙනත් EU+ රටක් වගකිව යුතු බවට තීරණය කර ඇත්නම්, **මාරු කර යැවීමේ තීරණයක්** ඔබට ලබා දෙනු ඇත. එම තීරණය ඔබව මාරු කරන්නේ කුමන රටට ද යන්න දැනුම් දෙනු ඇත.

මාරු කර යැවීමේ තීරණයකට ඔබ එකඟ නොවන්නේ නම්, ඔබට ඔබේ හේතු අධිකරණයට ලබා දිය හැකිය. මෙය අභියාචනයක් ගොනු කිරීම ලෙස හැඳින්වේ. ඔබ තීරණයක් අභියාචනා කරන විට, අධිකරණයක් හෝ විනිශ්චය සභාවක් අවසාන තීරණය ගනු ඇත.

මාරු කර යැවීමේ තීරණයකට අභියාචනයක් ඉදිරිපත් කිරීමට ඇත්තේ හේතු තුනක් පමණි:

- ඔබ කියා සිටින්නේ එම විශේෂිත EU+ රටට මාරු කර යැවීම ඔබේ මානව හිමිකම්වලට පටහැනි බවයි.
- මාරු කර යැවීමේ තීරණය ගත් අවස්ථාවේ නොතිබූ නව තොරතුරු මඟින් එම තීරණයට බලපෑමක් විය හැකිය.
- ඔබට වෙනත් EU+ රටක පවුලක් සිටින අතර, ඒ වෙනුවට ඔබ නැවත එක්විය යුත්තේ ඔවුන් සමඟයි.

ඔබට ඔබේම නීති උපදේශකයෙකු ලබා ගැනීමට වියදම් දරාගත නොහැකි නම්, අභියාචනය සඳහා ඔබට සහාය වීමට නීති උපදේශකයෙකු නොමිලේ ලබා දෙනු ඇත.



මෙම ක්‍රියාවලිය පුරාවට ම ඔබට වටහා ගත හැකි භාෂාවක් කතා කරන භාෂා පරිවර්තකයෙකු ඔබට සහාය වනු ඇත.

## අත්හිටුවන ලද බලපෑම සහ ස්වාධීන අභියාචනා ඒකාබද්ධ කළ විට අභියාචනා ක්‍රියාපටිපාටිය පිළිබඳ ව ඔබ දැනගත යුතු දේ

අභියාචනයක් ඉදිරිපත් කළ යුතු කාල සීමාව, ස්ථානය සහ කෙසේද යන්න ඔබට ලබා දී ඇති මාරු කිරීමේ තීරණයෙහි පැහැදිළි කෙරෙනු ඇත.

ඔබව වෙනත් EU+ රටකට මාරු කර යැවීමේ තීරණයට ඔබ එකඟ නොවීමට හේතුව හෝ හේතූන් ඔබ පැහැදිළි කළ යුතුය.

ඔබේ අභියාචනය ක්‍රියාත්මක වන අතරතුර ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීමට වගකිව යුතු EU+ රටට ඔබව මාරු කර යැවීම නොකළ යුතු හේතුව හෝ හේතූන් ද ඔබ ලබා දිය යුතුය.

ඔබේ අභියාචනය **මාස 1ක්** ඇතුළත ක්‍රියාත්මක වන අතරතුර, මෙම රට තුළ අභියාචනයේ ප්‍රතිඵලය එනතෙක් රැඳී සිටිය හැකි ද යන්න අධිකරණය පළමුවෙන් ම තීරණය කරනු ඇත. මෙය අත්හිටුවන ලද බලපෑම පිළිබඳ ව අභියාචනය ලෙස හැඳින්වේ.

මෙම රට තුළ අභියාචනයේ ප්‍රතිඵලය එනතෙක් රැඳී සිටිය නොහැකි බව අධිකරණය තීරණය කළහොත්, ඔබේ අභියාචනය ක්‍රියාත්මක වන අතරතුර ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු EU+ රටට ඔබව මාරු කරනු ඇත.

ඔබේ අභියාචනය පවතින අතරතුර ඔබට මෙම රටේ රැඳී සිටීමට අවසර දිය යුතු බවට අධිකරණය තීරණය කළහොත්, අත්හිටුවන ලද බලපෑම පිළිබඳ ව තීරණය ගත් දින සිට මාස 1ක් ඇතුළත ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීමට වගකිව යුතු EU+ රටට ඔබව මාරු කර යැවිය යුතු ද යන්න පිළිබඳ ව අවසන් තීරණයක් ලබා දීමට අධිකරණය උත්සාහ කරනු ඇත.

ඔබේ අභියාචනය පිළි නොගන්නේ නම්, ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු EU+ රටට ඔබව මාරු කර යවනු ඇත. අධිකරණය එහි අවසන් තීරණය ගත් දින සිට මාස 6ක් ඇතුළත මාරු කර යැවීම සිදු විය යුතුය.

ඔබ දැනට රඳවාගෙන සිටී නම් හෝ අනාගතයේ දී රඳවාගෙන සිටිනු ඇත්නම්, ඔබේ තත්ත්වය හදිසි තත්ත්වයක් ලෙස සලකනු ඇත. ඔබේ මාරු කර යැවීම සති 5ක් ඇතුළත සංවිධානය කළ යුතුය. සති 5ක් ඇතුළත මාරු කර යැවීම සිදු නොකළහොත්, ඔබව රඳවාගෙන සිටීමෙන් නිදහස් කරනු ඇත. කෙසේ වෙතත්, ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු EU+ රට ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා ඉල්ලීම පිළිගත් දින සිට මාස 6ක් ඇතුළත ඔබේ මාරු කර යැවීම තව දුරටත් පිළියෙළ කෙරෙනු ඇත.

**වැදගත් !** ඔබ බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කළ යුතු අතර ඔබේ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුතු EU+ රටට යා යුතුය.

## කුමන පුද්ගලික දත්ත රැස් කරනු ඇති ද?



ඔබ රැඳී සිටින EU+ රටේ නිලධාරීන් පහත සඳහන් තොරතුරු ඇතුළුව යම් යම් තොරතුරු රැස් කරනු ඇත:

- ඔබේ පුද්ගලික තොරතුරු සහ ඔබ සමඟ ගමන් කරන පවුලේ සාමාජිකයින්ගේ තොරතුරු (නම, ජාතිය, දිනය සහ උපන් ස්ථානය). ඔබ මීට පෙර විවිධ නම් සහ විස්තර භාවිත කර ඇත්නම්, ඔවුන් ඒ පිළිබඳ ව ඔබෙන් අසනු ඇත.
- ඔබේ අනන්‍යතාවය සහ සංචාරක ලේඛන පිළිබඳ ව තොරතුරු.
- ඔබේ අනන්‍යතාවය තහවුරු කළ හැකි වෙනත් ඕනෑම තොරතුරක්, ඔබේ ඇඟිලි සලකුණු වැනි.
- වෙනත් EU+ රටක පදිංචි ව සිටින ඕනෑම පවුලේ සාමාජිකයෙකු පිළිබඳ ව විස්තර, ඔවුන්ගේ පුද්ගලික තොරතුරු, ඔබ අවසන් වරට සම්බන්ධතා පැවැත් වූ අවස්ථාව, ඔවුන්ගේ ස්ථානය සහ ඔවුන්ගේ නීතිමය තත්ත්වය වැනි.
- ඔබේ තත්ත්වයට අදාළ වන්නේ නම්, EU+ රටක ජීවත් වීමට ඔබට අවසර දී ඇති ඔබ සතුව තිබෙන ඕනෑම ලේඛනයක් පිළිබඳ ව විස්තර.
- ඔබ වසරකට වැඩි කාලයක් EU+ රටක අධ්‍යාපනය ලැබූ බව පෙන්වන ලේඛන පිළිබඳ ව තොරතුරු.
- මෙම රටට ළඟා වීමට ඔබ ගමන් කළේ කුමන රටවල් හරහා ද යන්න පිළිබඳ ව තොරතුරු.
- ඔබේ පුද්ගලික තත්ත්වයන්.
- ජාත්‍යන්තර ආරක්ෂාව සඳහා පෙර ඉදිරිපත් කරන ලද අයදුම්පත්වල දිනය සහ එම අයදුම්පත්වල ප්‍රතිඵලය.

## ඔබේ පුද්ගලික දත්ත සම්බන්ධ ව ඔබට ඇති අයිතීන් මොනවාද?

ඔබ බලධාරීන්ට ලබා දුන් ඕනෑම දත්තයකට ප්‍රවේශ වීමට ඔබට අයිතිය ඇත.

ඔබේ යම් පුද්ගලික දත්තයක් සාවද්‍ය හෝ නීත්‍යානුකූලව සකසා නොමැති බව ඔබ විශ්වාස කරන්නේ නම්, සාවද්‍ය දත්ත නිවැරදි කරන ලෙස හෝ නීති විරෝධී ලෙස සැකසූ දත්ත මකා දමන ලෙස ඉල්ලා සිටීමට දත්ත පාලකය අමතා ඔබේ පුද්ගලික දත්ත වෙත ප්‍රවේශය ඉල්ලා සිටිය හැකිය.

පහත තොරතුරු භාවිතයෙන් ඔබට මෙම රටේ දත්ත පාලකය සම්බන්ධ කර ගත හැකිය.

www.nyidanmark.dk/da/Kontakt-os/Kontakt-Udl%C3%A6ndingestyrelsen/Kontakt-DPO

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025